## ජාතික අධ්‍යාපන ආයතනය
## පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
## (අර්ධ කාලීන 2012 / 2013, පූර්ණ කාලීන 2013)

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන උක්ත පාඨමාලාව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලාව පැවැත්වෙන ස්ථානය :** අධ්‍යාපන නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානය,
ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ හන්දිය, පාදුක්ක.

**පාඨමාලා කාලසීමාව :** පූර්ණ කාලීන - අවුරුදු එකයි.
අර්ධ කාලීන - අවුරුදු දෙකයි.
(මාසයකට සති අන්ත දෙකක් බැගින් හා පාසල් වාර නිවාඩු කාල තුළ)

**මාධ්‍යය :** පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ. (එසේ වුවද සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන ඕනෑම මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකිය. දේශන සාකච්ඡාවල දී ඉහත භාෂා තුනෙන් ම දායකත්වය ලබා දේ).

**ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් :**

(i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ / විදුහල්පති සේවයේ / ගුරු අධ්‍යාපනඥ සේවයේ සාමාජිකයකු වීම/ශ්‍රී ලංකා ගුරුසේවයේ I පන්තියේ සාමාජිකයකුවීම **හෝ** පිළිගත් අර්ධ රාජ්‍ය අධ්‍යාපන ආයතනයක / පිළිගත් අධ්‍යාපන ආයතනයක ප්‍රධානියකුවීම / පරිවේනාධිපති තනතුරක් හෙබවීම

(ii) (අ) පිළිගත් අධ්‍යාපන ආයතනයක / විශ්ව විද්‍යාලයක අධ්‍යාපනවේදී උපාධිය

**හෝ**

(ආ) (i) වෙනත් උපාධියක් **සහ** (ii) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව **හෝ** පුහුණු ගුරු සහතිකය **හෝ** ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව වැනි එක් වෘත්තීය සුදුසුකමක් තිබීම

(iii) අවුරුදු **හතරක** ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම සහ ඉන් අවුරුදු **දෙකක්** පරිපාලන හා අධීක්ෂණ කටයුතුවල නිරත ව සිටීම.

(iv) තෝරා ගනු ලබන අධ්‍යයන වර්ෂයේදී ජාතික අධ්‍යාපන ආයතනයේ කිසිදු පූර්ණ කාලීන / අර්ධ කාලීන පාඨමාලාවක් **හෝ** කිසියම් ආයතනයක පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරමින් නොසිටීම.

(v) අර්ධ කාලීන පාඨමාලාව සඳහා 2012. 06. 30 වෙනි දිනට වයස අවුරුදු 53ට අඩුවීම හා
පූර්ණ කාලීන පාඨමාලාව සඳහා 2012. 12. 31 වෙනි දිනට වයස අවුරුදු 53ට අඩු වීම

**බඳවා ගැනීමේ ක්‍රමය :**

I. (i) අධ්‍යාපන කළමනාකරණය

(ii) ඉංග්‍රීසි භාෂාව හා ඉගෙනුම් කුසලතා යනුවෙන් ප්‍රශ්න පත්‍ර දෙකක් සහිත ප්‍රවේශ විභාගයකින් ඉහළම ලකුණු ලබන අය සම්මුඛ පරීක්ෂණයකට කැඳවා සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**පාඨමාලාවේ ප්‍රතිලාභ :**

* ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ / ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරින්ගේ දෙවන කාර්යක්ෂමතා කඩඉම සඳහා මෙම සහතිකය පිළිගැනේ.

**ඉල්ලුම් කරන පිළිවෙළ :**

* මෙහි පහත දැක්වෙන ආදර්ශය අනුව ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ ඉල්ලුම් පත්‍රයක් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් නමින් ලංකා බැංකුවේ ඕනෑම ප්‍රධාන ශාඛාවකින් ගිණුම් අංක 7041168 ට (අදාළ ඉල්ලුම් පත්‍ර ගාස්තු රු. 200/- ක් හා ඇතුළත්වීමේ විභාග ගාස්තු රු. 500/-ක් එකතුව) රු. 700/- ක් බැර කොට ලබා ගත් ලදුපත සමග සහකාර අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යාපන නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානය, ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ හන්දිය, පාදුක්ක යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඔබගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වුවහොත් ඉල්ලුම් පත් ගාස්තුව සහ ඇතුළත්වීමේ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

**පාඨමාලා ගාස්තුව** : රු. 28 000/-

* ඉල්ලුම්පත් බහා එවනු ලබන කවරයේ උඩ වම් කෙළවරේ අදාළ පරිදි PGDEM - අර්ධ කාලීන 2012/2013 හෝ PGDEM පූර්ණ කාලීන 2013 යනුවෙන් සඳහන් කරන්න. අර්ධ කාලීන පාඨමාලාව 2012 ජූලි මාසයේ දී ද පූර්ණ කාලීන පාඨමාලාව 2013 ජනවාරි මාසයේ දී ද ආරම්භ වේ.

* **ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය** : අර්ධ කාලීන 2012 මාර්තු 31
පූර්ණ කාලීන 2012 ජූනි 30

මහාචාර්ය ඩබ්. එම්. අබේරත්න බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
2012 ජනවාරි 27 වන දින.

**Course Applied for**

| | |
|---|---|
| **Part Time** | |
| **Full time** | |

**Please Tick (✓)**

**Application for the Post Graduate Diploma in Education Management Course (Part time 2012/13 - Full Time 2013)**

01. Name in Full : Rev./Mr./Mrs./Miss …………………………………………………

02. Name with Initials : ……………………………………………………………………..

03. Address :

(i) Official : ……………………………………………………

Tel. : ……………………………………………………

(ii) Personal : ……………………………………………………

Tel. : ……………………………………………………

04. Age (by 30.06.2012 or 31.12.2012): …………………………..

05. Date of Birth : …………………………..

06. Present Post : …………………………..

07. Period of Service : …………………………..

08. Service you belong to

SLEAS ☐ SLPS ☐

SLTES ☐ SLTS – I ☐

Other ☐

Put a tick (✓) in the relevant cage

09. Qualifications :

Academic :

Professional :

I certify that the above mentioned particulars are true and correct. I also declare that I don't expect to follow any part time/ full time course except this course at the National Institute of Education **or** a full time course in any other higher education institute.

Date: ………………………….. …………………………….

Signature of the applicant

**Recommendation of the head of the institute:**

Recommended for the above mentioned course. He/She can be/cannot be released from duties if he/she is selected for it.

Date : ………………………… ………………………………..

Signature and frank